ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

**කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත් හා වාරිමාර්ග අමාත්‍යාංශය**

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

## කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2026

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පහත සඳහන් කලාප/ප්‍රදේශයන්හි රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය, 2024 හි 3.1.5 ඡේදයේ දැක්වෙන වෙළඳපල මිළ සැදෑහුම් ක්‍රමයට (shopping) ඉදිකිරීම් වැඩ කිරීමට යෙදෙන අවස්ථාවන්හිදී ඉදිකිරීම් වැඩ ප්‍රදානය කිරීම සඳහා, වසර 2026 වෙනුවෙන් සුදුසුකම්ලත් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමට බලාපොරොත්තු වේ.

01. බී කලාපය
02. සී කලාපය
03. ඩී කලාපය
04. ඊ කලාපය
05. ජී කලාපය/මොරගහකන්ද
06. එච් කලාපය
07. එල් කලාපය
08. හුරුළුවැව කලාපය
09. රඹකැන්ඔය කලාපය
10. ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය
11. වලව කලාපය
12. ප්‍රධාන කාර්යාලය

මේ සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක 500, ටී.බී. ජයා මාවත, කොළඹ 10 ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 09 මහලේදී 2025.12.30 වන දින 14.00 වන පැය තෙක් කොන්ත්‍රාත්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද අයදුම් පත් භාරගනු ලැබේ.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් මේ සඳහා පිළියෙල කර ඇති අයදුම්පත් වල ඉල්ලා සිටින විස්තර සපයමින් සිඩා (CIDA) ආයතනයේ ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන් හට මේ සඳහා ඉල්ලුම් කිරීමට හැක.

2026 වර්ෂය සඳහා ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන කොන්ත්‍රාත්කරුවන් **www.mahaweli.gov.lk** වෙබ් අඩවියට පිවිස "TENDERS" යටතේ ඇති "REGISTRATION OF CONTRACTORS - 2026" ට අදාල උපදෙස් පත්‍රිකාව කියවා අයදුම්පත්‍රය හා උපදෙස් බාගත (Download) කර එය සම්පූර්ණ කර ඕනෑම ලංකා බැංකු ශාඛාවකින්, හයිඩ් පාර්ක් ශාඛාවේ ඇති ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අංකය 2327542 වෙත ආපසු නොගෙවන ලියාපදිංචි ගාස්තුව රු 1000/= ගෙවීමෙන් අනතුරුව ලබාගත් රිසිට් පත, අමුණා (වැදගත් - කොන්ත්‍රාත් ආයතනයේ නම සහ "2026 වර්ෂය සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය" යනුවෙන් මුදල් බැරපතේ සඳහන් කරන්න) මුද්‍රා තබන ලද අයදුම්පත් මුල් පිටපත හා තවත් පිටපතකින් යුතුව කවරයේ උඩ වම් කෙළවර පැහැදිළිව **"කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2026"** යනුවෙන් සඳහන් කර අයදුම්පත් භාරගන්නා වේලාවට කලින් ලැබෙන සේ ප්‍රසම්පාදන අංශය, 9 වන මහල, අංක 500, ටී.බී. ජයා මාවත, කොළඹ 10 ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම කළ යුතුය. අයදුම්පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

මේ සම්බන්ධ වැඩි විස්තර නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් (තාක්ෂණ සේවා) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය තාක්ෂණ සේවා අංශය වෙතින් ලබාගත හැක. දුරකථන අංක 011-2687475, 011-2689651, වෙබ් අඩවිය www.mahaweli.gov.lk

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය